# 2000 න් එහා ලෝකය

## ලොව සැහැල්ලු වීඩියෝ කැමරාව




ජපානයේ නිෂ්පාදිත අලුත්ම වීඩියෝ කැමරාවයි මේ. **MB - DJ 100** නමින් හැඳින්වෙන මෙම නවතම සංඛ්‍යාංක වීඩියෝ කැමරාව පැනසොනික් ආයතනය මගින් නිෂ්පාදනය කර ඇත.

මෙම වීඩියෝ කැමරාව ලෝකයේ ඉතාමත් කුඩා සහ සැහැල්ලු කැමරාව ද වෙයි.

## මිනිසාට සමාන රොබෝ

2000 ලෝකයට එක්වන අලුත්ම නිර්මාණයයි මේ.

මිනිසකුගේ හැඩරුවට තැනූ මිනිසා විසින් කළ හැකි යම් යම් කටයුතු කිරීම සඳහා හැකියාව ඇති මේ නවතම රොබෝට්ටන් දෙදෙනා තනා ඇත්තේ ජපානයේ හොන්ඩා මෝටර් රථ නිෂ්පාදන සමාගමයි.

P 3 හා P 2 යන නම්වලින් හැඳින්වෙන මෙම රොබෝවරුන්ට තමාගේම දෙපයින් ඇවිදගෙන යාමටත්, මිනිසා විසින් කරන සරල ක්‍රියාවක් කිරීමටත් හැකියාව ඇත.

සෙ.මී. 160 ක් උස මෙම P 3 රොබෝට්ටා කි.ග්‍රෑම් 130 ක් බරය. P 2 රොබෝට්ටා සෙ.මී. 180 ක් උස වන අතර කි.ග්‍රෑම් 210 ක් බරය.






## දත් රකින චුවින්ගම්

චුවින්ගම් කෑම නිසා දත් නරක් වන බවයි බොහෝ දෙනාගේ අදහස. එහෙත් දත් රැකගන්නට චුවින්ගම් කන ලෙස ළඟදීම දන්ත වෛද්‍යවරුන් ඔබට උපදෙස් දේවි.

දන්ත පථ සෑදීම වළක්වන සීනි රහිත චුවින්ගම් වර්ගයක් නිපදවීමට ඇමෙරිකානු දන්ත විද්‍යාඥයන් පිරිසක් සමත්වෙලා.

මේ චුවින්ගම් වර්ගයේ රහසිගත සංයෝගය 'කැල්සයින් කේලින්' නම් රසායන ද්‍රව්‍යයි. දත්වල සෑදෙන දන්ත පථවලින් සියයට 30 ක් පමණම ඉවත්කර දමන්නටත්, එනැමලයට හානියක් නොකර දත මැද පවිත්‍ර කරන්නටත් මේ චුවින්ගම් වර්ගයට හැකියි.

නුදුරු අනාගතයේදී මේ චුවින්ගම් වර්ගය ශ්‍රී ලාංකිකයින් වන අපටත් හපන්න ලැබේවි.

## රියැදුරා නැතිව දුවන මෝටර් රථ




මෝටර් රථය ධාවනය කොම්පියුටර රියැදුරාට බාර දී පසුපස අසුනට වී පොතක්පතක් බලමින් නිවී හැනහිල්ලේ යන්නට ඉඩ ලැබෙන දිනය වැඩි ඈතක නොවේ.

මේ රියැදුරන් නැති රථය සම්පූර්ණයෙන්ම පාලනය කෙරෙන්නේ කොම්පියුටරයකිනි. රථය පණ ගැන්වීම, වේගය අඩු වැඩි කිරීම, තිරිංග තද කිරීම වැනි හැම වැඩක්ම කෙරෙන්නේ එමගිනි.

මේ රථය ගමන් ගන්නේ විශේෂිත කාන්දම් බලයෙන් යුතු ගමන් මගකය. මේ ගමන් මගට, වාහනයට උපදෙස් දෙන්නේන් රේඩාර් හා අධෝරක්ත කිරණ මගිනි. එපමණක් නොව ඉදිරි මාර්ගයේ වාහන තදබදය ගැන ඔබට උපදෙස් දෙන්නට ද මේ මෝටර් රථයට පුළුවන. එය කරනු ලබන්නේ චන්ද්‍රිකා පණිවුඩ ආධාරයෙනි.

දැනට ආසියාවේ ඇති වාහන ගණන කෝටි 10 ක් පමණ වේ. 2010 දී එය දෙගුණයක් පමණ වෙනු ඇත.

වාහන වැඩිවීම නිසා මාර්ග අනතුරු වැඩිවන අතර එම අනතුරුවලින් සියයට 90 ක්ම සිදු වන්නේ මිනිසුන්ගේ (රියැදුරන්ගේ) වැරදි නිසාය.

අනාගතයේ දී බිහිවන මේ රියැදුරන් රහිත රථ නිසා මාර්ග අනතුරු සංඛ්‍යාව අඩුවෙතැයි ද විශ්වාස කෙරේ.

හදිසි අවස්ථාවකදී තීරණ ගැනීමට රියැදුරන්ට වැඩි වේලාවක් ගතවෙයි. එහෙත් කොම්පියුටරයට ක්ෂණිකව තීරණ ගෙන අනතුරු වළක්වා ගත හැක. දැනටමත් ඇමෙරිකාව හා ජපානය මෙවැනි මෝටර් රථයක් සඳහා සුදුසු මාර්ග සැලසුම් කරමින් සිටී. නව අවුරුදු 15 කින් පමණ මේ සිහිනය සැබෑවක් වනු ඇත.